# ආර්ථික හැඩගැස්ම 1985

## සමාලෝචනය

විදේශ ආර්ථික වාතාවරණය රටට අහිතකර තත්ත්වයක සහ රටෙහි ඇතැම් පළාත් නොසන්සුන් තත්ත්වයක පවතිද්දීත්, මිළ ස්ථාවරත්වයක්ද සහිතව සියයට 5 ක ආර්ථික වර්ධන අනුපාතිකයක් 1985 වසර තුළ අත් කර ගැනීම සුවිශේෂ කරුණකි. කෘෂිකාර්මික සහ නිෂ්පාදන අංශයන් එකී වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක විය.

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ (ද. දේ. නි.) ඇති වූ සියයට 5 ක වර්ධනය 1984 වර්ෂයේ දී වූ සියයට 5.1 ක සහ 1983 දී සටහන් වූ සියයට 5 ක වර්ධනයන් හා සැසඳිය හැක. සාධක ආදායම්හි ශුද්ධ පිටගලා යාම අඩුවීමේ හේතුවෙන් මූර්ත දළ ජාතික නිෂ්පාදිතය (ද. ජා. නි.) සියයට 5.3 කින් වැඩි වූ අතර, 1984 දී මෙය සියයට 5.1 කින්ද, 1983 දී සියයට 4.1 කින්ද වැඩි විය. පවත්නා සාධක පිරිවැය මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය 1984 වර්ෂයට වඩා සියයට 6.7 කින් වැඩි විය. 1985 දී ඒක පුද්ගල දළ ජාතික ආදායම සියයට 3.7 කින් වැඩි වී රුපියල් 9,219 (එ. ජ. ඩොලර් 339) ක් විය.

ආරෝපිත ද. ජා. නි. අවධමනකයේ වැඩි වීම සියයට 1.5 ක් පමණක් වීම, ඉකුත් වසරේ සියයට 17.4ක වැඩි වීම හා සසඳන විට තියුණු වෙනසක් දක්විය. කොළඹ පාරිභෝගික මිළ දර්ශකයෙහි දක්වෙන පරිදි පාරිභෝගික මිළ ගණන් වැඩි වූයේද සියයට 1.5 කිනි. 1978 ට පසුව වාර්තා වූ ඉතාම සුළු වැඩි වීමද මෙයවිය. මෙවැනි අඩු උද්ධමන අනුපාතිකයක් ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කෘෂිකාර්මික වෙළෙඳ ද්‍රව්‍යයන්හි වැඩි සැපයුම, සාපේක්ෂ වශයෙන් ස්ථාවර වූ ආනයන මිළ ගණන්, ඛනිජ තෙල් නිෂ්පාදිත සම්බන්ධයෙන් වූ ස්ථාවර දේශීය මිළ ගණන්, 1984 දී අනුගමනය කළ ප්‍රසාරණාත්මක නොවන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති නිසා ඇතිවූ පසුකාලීන බලපෑම් සහ 1984 වර්ෂයේ සිට අනුගමනය කළ ණය පාලන ප්‍රතිපත්තිවල බලපෑමය.

1985 දී ආර්ථික සංවර්ධනයේ ලා කැපී පෙනෙන පසු බෑමක් වූයේ තේ සහ පොල් ප්‍රධාන කොට ගත් වෙළෙඳ ද්‍රව්‍යවල මිළ පහත වැටීමය. 1985 ආර්ථික ක්‍රියාකාරිත්වය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑ අනෙක් අහිතකර කරුණු වූයේ, සංචාරකයින්ගේ පැමිණීම දිගින් දිගටම පහත වැටීම, එහි ප්‍රතිඵලයක් වශයෙන් සංචාරක කර්මාන්තය මත රඳා පවතින අනෙකුත් සේවාවන් පිරිහීම, ස්වදේශ ආරක්ෂාව හා සම්බන්ධ කාර්යයන් වෙනුවෙන් වැය කරන වියදම ඉහළ යාම, විදේශීය ආයෝජන කෙමෙන් අඩු වීම සහ දිවයිනේ උතුරු හා නැගෙනහිර පළාත්වල ආර්ථික කටයුතු ව්‍යාකූලත්වයකට පත් වීමය.

DISCARDED

මෙකී අහිතකර සාධක මධ්‍යයේ වුවද, මෙවැනි කැපී පෙනෙන අනුපාතිකයකින් ආර්ථිකය වර්ධනය වූයේ, රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් හතරෙන් පංගුවකට පමණ දායක වන කෘෂිකාර්මික අංශයේ ඇතිවූ අඛණ්ඩ ප්‍රසාරණය නිසාය. තාවකාලික වශයෙන් බලපෑ අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුකොටගෙන 1984 දී පහත වැටුන වී නිෂ්පාදනය නැවතත් ඉහළ වර්ධන මාවත කරා යමින් 1985 දී සියයට 10 ක වාර්තාගත නිෂ්පාදනයක් අත්කර ගත්තේය. පොල් නිෂ්පාදනය සියයට 52 කින් තියුණු ලෙස වැඩි විය. ඉකුත් වසරේදී සියයට 16 කින් ඉහළ නැගි තේ නිෂ්පාදනය, තවත් සියයට 3 කින් වැඩි විය. දේශීය කෘෂි කර්මාන්තයේ මෙන්ම, වැවිලි භෝග අංශයේද ඇතිවූ මෙකී වර්ධනය සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් කෘෂි සැකසුම් කර්මාන්තය හා වෙළෙඳාම කෙරෙහි ඇතිවූ බලපෑම සියයට 5 ක වර්ධන අනුපාතිකයක් පවත්වා ගැනීමෙහි ලා බෙහෙවින් උපකාරී විය.

1984 දී සියයට 15 කින් වැඩි වූ කාර්මික අංශයේ නිෂ්පාදනයද සියයට 5 ක අඩු වේගයක් වාර්තා කරමින් නොකඩවා වර්ධනය විය. මෙම වර්ධනය මෙවරද වාර්තා කර ඇත්තේ පෞද්ගලික අංශයේ කම්හල් මගින් වූ අතර, ඒවායේ කාර්මික නිමැවුම් අගය සියයට 20 කින් වැඩි වී ඇත. 1984 දී සියයට 26 ක ඉහළ වර්ධන අනුපාතිකයක් වාර්තා කළ පෞද්ගලික නිෂ්පාදන අංශය, 1985 දීද මෙවැනි ඉහළ වර්ධන අනුපාතිකයක් වාර්තා කරනු ලැබුයේ වුවද, රාජ්‍ය කර්මාන්ත අංශයේ සියයට 6 ක පහත වැටීමක් දක්නට ලැබිණි.

1985 දී නව සේවා නියුක්ති අවස්ථා ජනිත වීම තරමක්දුරට සීමා වූ බවට සළකුණු ඇත. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය සියයට 1.5 කින් වැඩි වී ඇති බවට ගණන් බලා ඇති නමුත්, අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිය සියයට 2.4 කින් පහත වැටී ඇත. රාජ්‍ය අංශයේ ආයතන කීපයක සිදු කළ ආර්ථික සීමා කිරීමද, දුර්වල ක්‍රියාකාරිත්වයකින් යුක්ත වූ අර්ධ රාජ්‍ය ආයතන කිහිපයක් පෞද්ගලික අංශයට පැවරීමද, අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිය පහත වැටීමෙන් පිළිබිඹුකෙරුණි. පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය සංවිධානාත්මක වූ මෙන්ම සංවිධාන නොවූ යන උප අංශ දෙකෙහිම තරමක්දුරට වැඩි වී ඇති බව පෙනේ. එහෙත් ඒ පිළිබඳ ස්ථාවර සංඛ්‍යා තොරතුරු තවම ලබා ගෙන නොමැත.

ප්‍රධාන වශයෙන් අපනයන මිළ ගණන් තියුණු ලෙස පහත වැටීම නිසා රටේ වෙළෙඳ ක්‍රියාකාරිත්වය අහිතකර තත්ත්වයකට පත් විය. 1972 න් පසු ප්‍රථම වරට අපනයන වටිනාකම් පහත වැටුණ අතර, ආනයන වියදම් ඉකුත් දෙවසරට වඩා වැඩි වේගයකින් වර්ධනය විය.

තේ මිළ ගණන් සියයට 26 කින්ද, රබර් මිළ ගණන් සියයට 23 කින්ද, පොල් මිළ සියයට 49 කින්ද පහත වැටීම, වෙළෙඳ ද්‍රව්‍ය මිළ පහත වැටීමේ හේතුවෙන් ඇති වූ බලපෑමේ ප්‍රමාණය මැන ගත හැකි සාධක වේ. 1977 වර්ෂයේ සිට නොකඩවා වර්ධනයක් පෙන්නුම් කළ රෙදිපිළි සහ මසා නිම කළ ඇඳුම් අපනයනය සියයට 1 කින් පහත වැටුණු අතර, වෙනත් කාර්මික නිෂ්පාදිත අපනයන සියයට 4 කින් වැඩි විය. ඛනිජ තෙල් නිෂ්පාදන අපනයන සියයට 11 කින් වැඩි වුවද, සම්ප්‍රදයික නොවන අපනයනයන්ගේ ඒකාබද්ධ වැඩි වීම සියයට 8 ක් පමණක් විය.

වෙළෙඳ භාණ්ඩ ආනයනය සඳහා දරු වියදම වැඩි වූයේ පාරිභෝගික හා අන්තර් භාණ්ඩ ආනයනය ඉහළ යාම නිසාය. සහල්, සීනි සහ තිරිඟු පිටි වැනි ආහාර ද්‍රව්‍ය ආනයන වැඩි වීම, පාරිභෝගික ආනයන සඳහා වැඩි වියදමක් දැරීමට හේතු වූ ප්‍රධාන කරුණ විය. අන්තර් භාණ්ඩ ආනයන සඳහා වූ වියදම වැඩි වූයේ පොහොර ආනයන වැඩි වීම නිසාය.

1985 වර්ෂයේදී ගෙවුම් තුලන තත්ත්වයේ ඇති වූ සැළකිය යුතු පිරිහීම ඉතාමත් අහිතකර සිදුවීම් වලින් එකක් විය. ජංගම ගිණුමෙහි මෙන්ම සමස්ත ශේෂයෙහිද පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මූලික වෙළෙඳ භාණ්ඩ මිළ ගණන් පහත වැටීම, සම්ප්‍රදයික නොවන අපනයන බොහොමයක දුර්වල ක්‍රියාකාරිත්වය සහ ආනයන පරිමාවන් වැඩි වීමය.

බලශක්ති තත්ත්වය දියුණු කිරීම සඳහා මෑත වසරවලදී ගනු ලැබූ වැදගත් පියවර නිසා ඇති වූ සාර්ථක ප්‍රතිඵල 1985 වර්ෂය තුළදී දක්නට ලැබිණ. ස්ථාපිත ධාරිතාව වැඩි කිරීමත්, ජලාශවල ප්‍රමාණවත් ජල මට්ටම් පවත්වා ගැනීමත් නිසා 1985 වර්ෂය තුළදී උත්පාදනය කරන ලද ජල විදුලිය ප්‍රමාණය වැඩි විය. ජල විදුලිය බල සැපයුම ඉහළ යාම නිසා බලශක්ති සැපයුම වැඩි වීම පමණක්ම නොව එමගින් ඛනිජ තෙල් මුල් කොටගෙන තාප බලය උත්පාදනය කිරීම පහළ යාම සහ ඛනිජ තෙල් පාරිභෝජනය අඩු වීමද සිදුවිය. මේ අනුව මුළු වාණිජ බල සැපයුමෙහි අඩංගු ඛනිජ තෙල් ප්‍රමාණය 1984 දී පැවති සියයට 60 සිට 1985 දී සියයට 54 දක්වා අඩු විය. මෙකී හැඩ ගැසීම් සහ ඛනිජ තෙල් සඳහා වූ අඩු ජාත්‍යන්තර මිළ ගණන්ද හේතු කොට ගෙන ඛනිජ තෙල් ආනයනයන්හි වටිනාකම විගැහි අනුව සියයට 9 කින් පහත වැටුණ අතර එමගින් ගෙවුම් තුලනය කෙරෙහි ඇතිවූ පීඩනයද අඩු විය.

ඉකුත් දෙවසර තුළ පැවති රාජ්‍ය මූල්‍ය කටයුතු උපනතියෙහි ආපසු හැරීමක් දක්නට ලැබින. 1985 අයවැය කටයුතු, ඉකුත් වසරට වඩා ප්‍රසාරණාත්මක විය. අපනයන වෙළෙඳ භාණ්ඩ මිළ පහත වැටීම ප්‍රධාන කොටගෙන රජයේ අපනයන ආදායම අඩු වීමත්, ස්වදේශ ආරක්ෂාව හා සම්බන්ධ කාර්යයන් සහ රාජ්‍ය ව්‍යවසායයන්හි සිදු වූ අලාභ නිසා රජයේ වියදම නොකඩවා පුළුල් වීමත් හේතුකොටගෙන අයවැය පරතරය වැඩි විය. අයවැය පරතරය පියවීමේදී ප්‍රසාරණාත්මක මූලයන්ගෙන් සම්පත් ලබා ගැනීමට රජයට සිදු විය. ඊට හේතු වූයේ විදේශීය සහ ප්‍රසාරණාත්මක නොවන මූලයන්ගෙන් ලබා ගත හැකි වූ සම්පත් ප්‍රමාණය අවශ්‍යතාවයන් සපුරා ලීමට ප්‍රමාණවත් නොවීමය.

1985 වර්ෂයේ මූල්‍ය හා ණය ක්ෂේත්‍රයෙහි විකාශනයන් සම්බන්ධයෙන් කැපී පෙනුන ප්‍රධාන කරුණු වූයේ මූල්‍ය සමස්තයන්ගේ වර්ධනය අඩු වීම, රජයට දෙන ලද ශුද්ධ ණය ප්‍රමාණය තියුණු ලෙස වැඩි වීම, පෞද්ගලික අංශයට දෙන ලද ණය ප්‍රමාණය මධ්‍යස්ථ ලෙස වැඩි වීම, බැංකු කටයුතු අංශයේ ශුද්ධ විදේශ වත්කම් හා තැන්පතු සඳහා වූ පොළී අනුපාතිකයන්හි පහත වැටීමය.

නොකඩවා දෙවන වර්ෂයේදීත් මූල්‍ය සමස්තයන්ගේ වර්ධන වේගයේ අඩු වීමක් වාර්තා විය. මෙවැනි තත්ත්වයක් අත්කර ගත්තේ රජයට දෙන ලද ශුද්ධ ණය ප්‍රමාණයේ තියුණු වැඩි වීමක්ද, පෞද්ගලික අංශයට දෙන ලද ණය ප්‍රමාණයේ මධ්‍යස්ථ වැඩි වීමක් හා බැංකු ක්‍රමයේ විදේශ වත්කම් (ශුද්ධ) පහත වැටීමක්ද මධ්‍යයේය. 1984 දී සියයට 14 ක වැඩි වීම හා සසඳන කල වර්ෂය තුළදී පටු මුදල් සැපයුම ($M_1$) සියයට 12 කින් වැඩි විය. ඉකුත් වසරේ සියයට 17 කින් වැඩි වූ පුළුල් මුදල් සැපයුම ($M_2$) 1985 වර්ෂයේදී සියයට 11 කින් වැඩි විය.

**දළ ජාතික නිෂ්පාදිතය, ආදායම සහ වියදම**

1985 දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය වැඩි වූයේ සියයට 5.0 කිනි. එය 1984 දී සියයට 5.1 කින් වැඩි විය. පිටත ගිය ශුද්ධ සාධක ආදායම් ප්‍රමාණය අඩු වීම, මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ සියයට 5.3 ක වැඩි වීමකට හේතු වූ අතර, 1984 දී එම වැඩි වීම සියයට 5.1 ක් විය.

පවත්නා සාධක මිළ අනුව, දළ ජාතික නිෂ්පාදිතය, රුපියල් දශ ලක්ෂ 1,46,000 ක් ලෙස ගණනය කර ඇති අතර, එය 1984 ට වඩා සියයට 6.9 ක වැඩි වීමකි. පසුගිය වසරේ පැවති සියයට 17.4 ක වැඩි වීමට එරෙහිව මෙවර ආරෝපිත මිළ අවධමනකයේ වැඩි වීම ගණනය කර ඇත්තේ සියයට 1.5 ක් වශයෙනි. දළ ජාතික නිෂ්පාදිත අවධමනකයේ සැළකිය යුතු අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදිතවල අපනයන මිළ ගණන් පහත වැටීමයි.

ශ්‍රී ලංකාවේ මැදි වසර ජනගහනය දශ ලක්ෂ 15.8 ක් ලෙස තාවකාලිකව ගණනය කර ඇති අතර, එය 1984 ඇස්තමේන්තුවට වඩා සියයට 1.5 ක වැඩි වීමක් ලෙස වාර්තා විය. එම නිසා ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය සියයට 5.3 කින් වැඩි වී රුපියල් 9,219 ක් (එ. ජ. ඩොලර් 339 ක්) විය. ඒක පුද්ගල ආදායමේ මූර්ත වැඩි වීම සියයට 3.7 ක් ලෙස ගණනය කර ඇත.

දළ දේශීය වියදමෙහි (ද. දේ. වි.) ප්‍රසාරණාත්මක වේගය තවදුරටත් කෙමෙන් අඩු විය. එය 1985 දී සියයට 10.0 ක් වූ අතර, 1983 දී සියයට 18.6 ක්ද, 1984 දී සියයට 16.4 ක්ද විය.

වර්තන මිළ අනුව, 1985 දළ දේශීය වියදම ඉකුත් වසරේ පැවැති මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 16,300 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 1,79,000 ක් විය. පෞද්ගලික පාරිභෝජන වියදම සියයට 10.7 කින් වැඩි වී 1985 දී රුපියල් දශ ලක්ෂ 1,23,200 ක් විය. මෙම සංඛ්‍යාවෙන් රුපියල් දශ ලක්ෂ 27,000 ක් විදේශීය භාණ්ඩ සහ සාධක නොවන සේවා

සම්බන්ධයෙන් වූ අතර, එය ඉකුත් වසරේ ප්‍රමාණයට වඩා සියයට 24.3 ක වැඩි වීමක් විය. රුපියල් දශ ලක්ෂ 96,200ක් දේශීය නිෂ්පාදන භාණ්ඩ සඳහා වැය වූ අතර, එය ඉකුත් වසරේ වියදමට වඩා සියයට 7.4 ක වැඩි වීමක් විය. රාජ්‍ය අංශයේ පරිභෝජන වියදම ඉකුත් වසරට වඩා සියයට 23.4 කින් වැඩිවිය.

ඉකුත් වසරේ වාර්තා වූ සියයට 13 ක වර්ධනය හා සසඳන විට තොග වෙනස්වීම්ද ඇතුළත් වන දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය ( ද. දේ. ප්‍රා. ස.) වැඩි වූයේ සියයට 4.1 කින් පමණි. 1984 වර්ෂයේදී වාර්තා කළ සියයට 11.8 ක වර්ධනයට එරෙහිව පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සංස්ථාවල ඒකාබද්ධ ප්‍රාග්ධන සම්පාදනය සියයට 7.3 කින් අඩු විය. ඉකුත් වර්ෂයේදී වැඩි වූ සියයට 18.9 හා සසඳන කල රාජ්‍ය අංශයේ දළ ප්‍රාග්ධන සම්පාදනය, 1985 දී සියයට 57.3 කින් වැඩි විය.

ඉකුත් වසරේදී සියයට 11.9 කින් වැඩිවූ දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය (ද. දේ. ස්ථා. ප්‍රා. ස.) 1985 දී සියයට 3.9 ක වර්ධනයක් වාර්තා කළේය. 1984 දී සියයට 5.0 කින් වැඩිවූ ආනයනය කළ ආයෝජන භාණ්ඩවල මුළු අගය 1985 දී සියයට 17.1 කින් පහත වැටුණි. දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ ආනයන සංයුතිය 1984 දී සියයට 28.9 ක් වූ අතර, 1985 දී එය සියයට 23.1 ක් විය. මහවැලි යෝජනා ක්‍රමයේ ප්‍රධාන වැඩ කටයුතු නිමවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය විශාල ලෙස අඩු විය.

1985 දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයෙන් වැඩි කොටසක් (සියයට 73.2 ක්) අයත් වූයේ පෞද්ගලික අංශයට සහ රාජ්‍ය සංස්ථාවලටය. 1984 වර්ෂයේදී මෙන්ම, ප්‍රාග්ධන සම්පාදනයෙන් විශාලතම කොටස ගොඩනැගිලි සහ අනෙකුත් ඉදි කිරීම් කටයුතුවල විය. ඉඩම් සංවර්ධන සහ නැවත වගා කටයුතුවල ප්‍රාග්ධන සම්පාදනය සියයට 32.1 කින් වැඩි විය.

1985 වර්ෂය තුළදී ආර්ථිකය සතු වූ මුළු සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,21,300 ක් වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 1,59,800 ක් දේශීය මාර්ගයන්ගෙන්ද, රුපියල් දශ ලක්ෂ 61,500 ක් ආනයනවලින්ද ලැබිණි. 1985 දී මුළු සම්පත් ප්‍රමාණයෙන් සියයට 72.2 ක්ම දේශීය සම්පත්වලින් සමන්විත වූ අතර, එය 1984 දී සියයට 74.2 ක් විය. සම්පත්වලින් සියයට 18.7 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහා වැය කළ අතර, සියයට 62.3 ක් පරිභෝජනය සඳහා වැය විය. 1984 වර්ෂයේදී ප්‍රාග්ධන සම්පාදනය සඳහා වැය කළ ප්‍රමාණය සියයට 19.2 ක් වූ අතර, පරිභෝජනය සඳහා වැය කළ ප්‍රමාණය සියයට 59.5 ක් විය. 1985 දී මුළු සම්පත් ප්‍රමාණයෙන් සියයට 19.0 ක් භාණ්ඩ සහ සාධක නොවන සේවා අපනයන වූ අතර, 1984 දී එය සියයට 21.4 ක් විය.

ඉකුත් වර්ෂ දෙකෙහිදී දක්නට ලැබුණු උපනතියට ප්‍රතිවිරුද්ධව මෙම වසරේදී දේශීය ඉතිරි කිරීම් සියයට 28.3 කින් පහත වැටිණි. 1984 දී රුපියල් දශ ලක්ෂ 30,600 ක් වූ දේශීය ඉතිරි කිරීම් ප්‍රමාණය 1985 දී රුපියල් දශ ලක්ෂ 21,900 දක්වා පහත වැටිණ. 1985 දී දේශීය ඉතිරි කිරීම් ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් (වෙළෙඳ මිළ අනුව) සියයට 13.7 ක් වූ අතර, 1984 දී එය සියයට 19.9 ක් විය. ශුද්ධ විදේශීය සාධක ආදායම සහ පෞද්ගලික සංක්‍රාම ඇතුලත් වන මුළු ජාතික ඉතිරි කිරීම් ප්‍රමාණය සියයට 24.6 කින් අඩුවී 1985 දී රුපියල් දශ ලක්ෂ 25,800 ක්ව පැවතිනි. දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයන් වශයෙන් ජාතික ඉතිරි කිරීම් ගත් කල, 1984 දී සියයට 22.2 ක්ව පැවති අනුපාතය 1985 දී සියයට 16.1 දක්වා පහත වැටිණි.

### ආංශික ක්‍රියාකාරිත්වය

කෘෂිකාර්මික අංශයේ ඇතිවූ වර්ධනය 1985 වර්ෂයේ වඩාත්ම කැපී පෙනුන ආංශික වර්ධනය විය. ඉතා පැහැදිලි වැඩි වීම් දක්නට ලැබුනේ පොල් සහ වී නිෂ්පාදනයන්හිය. ඉකුත් වසරේදී මෙකී නිෂ්පාදන දෙවර්ගයම අඩු විය.

1984 දී සියයට 16 කින් වැඩි වූ තේ නිෂ්පාදනය 1984 දී වූ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 208 සිට 1985 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 214 දක්වා තවත් සියයට 3 කින් වැඩි විය. ඉහළ ගිය තේ නිෂ්පාදන ප්‍රමාණය මුළුමනින්ම පාහේ පහත් බිම් තේ වලින් යුක්ත විය. ප්‍රථම වරට සමස්ථ තේ නිෂ්පාදනයේ විශාලතම කොටස පහත් බිම් තේ වලින් සංයුක්ත වීම, තේ නිෂ්පාදනයෙහි ලා කැපී පෙනුන වර්ධනය විය. ඉකුත් වර්ෂයේදී පැවති වාසිදායක තේ මිළ ගණන්වලට කුඩා තේ වතු හිමියන් දක්වූ ප්‍රතිචාරයක් ලෙස එකී නිෂ්පාදන ඉහළ යාම සැළකිය හැකිය.

මෑත වර්ෂ කිහිපය තුළදී ඉහළ මට්ටමක පැවති රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 4 කින් අඩු වී, 1985 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 138 ක් විය. කිරි කැපෙන බිම් ප්‍රමාණය මෙන්ම ඵලද මට්ටම්ද බොහෝදුරට ස්ථාවරව පැවති නමුදු, රබර් නිෂ්පාදන ප්‍රදේශවල පැවති අධික වර්ෂාව නිසා කිරි කැපීම අඩු විය. ඉකුත් වර්ෂයේදී මෙන්ම නිෂ්පාදනයේ අඩුවීම මුළුමනින්ම සිදු වූයේ රාජ්‍ය අංශයේ වතු වලය.

පොල් නිෂ්පාදනය සියයට 52 ක් තරම් ඉහළ ප්‍රමාණයකින් වැඩි වී ගෙඩි දශ ලක්ෂ 2,958 ක නව මට්ටමකට ළඟා වූ අතර, මෙය 1972 න් පසු වාර්තා වූ ඉහළම නිෂ්පාදනය විය. කලින් වර්ෂයේ පැවති හිතකර කාලගුණික තත්ත්වයන් සහ වැඩි පොහොර භාවිතය, නිෂ්පාදනයේ මෙකී වැඩි වීමට හේතු වූ කරුණු විය.

අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා ඉකුත් වර්ෂයේදී පහත වැටුණු වී නිෂ්පාදනය, 1984–85 මහ කන්නයේදී යථා තත්ත්වයට පත්ව මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.75 ක් විය. ඉකුත් මහ කන්නයට වඩා සියයට 29 ක් වූ මෙම වැඩි වීමේ වාසිය, 1985 යල කන්නයේදී සියයට 14 කින් (මෙට්‍රික් ටොන් 1,50,000) නිෂ්පාදන පහත වැටීම නිසා අවාසනාවන්ත ලෙස කැපී ගියේය. එකී යල කන්නයේදී දිවයිනේ වී වගා කරන ප්‍රදේශ බොහොමයකම ගංවතුර නිසා අස්වැන්නට හානි සිදුවිය. මේ අනුව, 1985 නිෂ්පාදනයේ ශුද්ධ වැඩි වීම සියයට 10 ක් පමණක් විය. වියළි කලාපයේ ඇතැම් වී වගා ප්‍රදේශ වලින් ඉතා ඉහළ සාමාන්‍ය ඵලද මට්ටම් වාර්තා විය. උඩවලවේ, මහවැලි ' එච් ' කලාපය සහ පොළොන්නරුව දිස්ත්‍රික්කය මේ අතුරින් ප්‍රමුඛස්ථ විය.

අතුරු ආහාර භෝග වගා අංශයේ ක්‍රියාකාරිත්වය 1985 දී තවදුරටත් දුර්වල තත්ත්වයක පැවතිණි. මහ කන්නයේදී වී වගාව සඳහා ප්‍රමාණවත් තරම් ජලය ලබා ගත හැකි වීම, එම කන්නය තුළ අතුරු ආහාර භෝග වගා කළ බිම් ප්‍රමාණය පහත වැටීමට හේතු වූ වැදගත් සාධකයකි. මහ කන්නයේ එකී පහත වැටීම තරමක්දුරට මකාලමින්, යල කන්නයේ අතුරු ආහාර භෝග නිෂ්පාදනය වැඩි විය.

මිරිස්, රතුළූනු, රටකජු සහ උළුඳු නිෂ්පාදනය වැඩි විය. උතුරු හා නැගෙනහිර පළාත් වලින් මිරිස් සහ රතුළූනු සැපයුම අඩු වීම, ඒවා අනෙකුත් ප්‍රදේශවල වගා කිරීම සඳහා පෙළඹවීමක් විය. අනෙක් අතට, සහල් මිළ පහත වැටීමත් සහල් වගාකරන ප්‍රදේශවල වඩා හොඳ වාරිමාර්ග පහසුකම් සපයා තිබීමත් නිසා ඉරිඟු, සෝයා සහ අල වර්ග වැනි සහල් ආදේශන භෝග නිෂ්පාදනය අඩු වූ බව පෙනේ.

සුළු අපනයන භෝග නිෂ්පාදනය පහත වැටුණු බව අපනයන දත්ත ඇසුරෙන් සකස් කළ ගණනය කිරීම් වලින් පෙනී යයි. ගම්මිරිස්, කරාබුනැටි, සාදික්කා, බුලත් සහ අත්‍යවශ්‍ය තෙල් වර්ග නිෂ්පාදනය සැළකිය යුතු ලෙස පහත වැටිණි. මෙම පහත වැටීමට වාරික සාධක හේතු වූවා විය හැකිය. එහෙත් 1985 දී කෝපි, කරදමුංගු, තල සහ කොකෝවා නිෂ්පාදනය වැඩි වූ අතර හොඳ ජාත්‍යන්තර මිළ ගණන්වලට හා වඩා හොඳ පහසුකම් වලට දක්වූ ප්‍රතිචාරය මෙමගින් පිළිබිඹු විය.

ඉකුත් වසරේ සියයට 15 කින් වැඩි වූ කර්මාන්ත අංශයේ නිමැවුම 1985 දී සියයට 5 කින් වැඩි විය. පිරිපහදුවේ ඛනිජ තෙල් නිමැවුම පහත වැටීම සහ රාජ්‍ය අංශයේ ඇතැම් වැදගත් කර්මාන්ත සංස්ථා කිහිපයක දුර්වල ක්‍රියාකාරිත්වය, කර්මාන්ත අංශයේ නිමැවුම් වර්ධනය සෙමින් සිදු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. පෞද්ගලික අංශයේ කර්මාන්ත අගය සියයට 20 කින් වැඩි වූ නමුදු, රාජ්‍ය අංශයේ කර්මාන්ත අගය සියයට 6 කින් පහත වැටිණි. ඛනිජ තෙල් කර්මාන්තය හැරුණු විට රාජ්‍ය අංශයේ අනෙකුත් සංස්ථා සියයට 2 කින් වර්ධනය විය. උතුරු සහ නැගෙනහිර පළාත්වල පවතින කැළඹීම්, එකී පළාත්වල පිහිටි ඇතැම් රාජ්‍ය අංශයේ කර්මාන්ත සංස්ථාවන්හි දුර්වල ක්‍රියාකාරිත්වයට හේතු විය.

පෞද්ගලික අංශයේ නිමැවුම සියයට 20 කින් ඉහළ නැංවීමට ආහාර පාන සහ දුම්කොළ, රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් සහ කඩදාසි හා කඩදාසි නිෂ්පාදිතයන්හි වැඩිවීම ඉවහල් විය. දේශීය හා විදේශීය වශයෙන් ඇති වූ අහිතකර සාධකයන් 1985 දී කර්මාන්ත අංශයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑවේය. කාර්මික අපනයන සඳහා වූ පහත් ඉල්ලුමද, තීරු බදු නොවන බාධකයන්ද අපනයන වර්ධනය අධෛර්යමත් කරවන සුළු බලපෑමක් ඇති කළේය.

පතල් හා කැනීම් කටයුතු අංශයේ වර්ධනය සීමා වීමට හේතු වූයේ ඉදි කිරීම් ද්‍රව්‍ය සඳහා ඉල්ලුම අඩු වීම සහ මැණික් අපනයනය අඩු වීමය. 1978 සිට 1980 දක්වා ඉතා ඉහළ වර්ධන අනුපාතික වාර්තා කළ ඉදි කිරීම් අංශයේ ක්‍රියාකාරිත්වය සෙමින් සිදු විය. ඊට හේතු වූයේ, මහවැලි යෝජනා ක්‍රමයේ ඉදි කිරීම් කටයුතු වැඩි ප්‍රමාණයක් නිම වීම, නිවාස අවශ්‍යතා සඳහා පැන නැගුණු ඉල්ලුම සෑහෙන දුරට සපුරා තිබීම, රාජ්‍ය අංශයේ ඉදි කිරීම් කටයුතු අඩු වීම සහ අඩු වියදම් වලින් ඉදි කෙරෙන නිවාස කෙරෙහි ජනතාව නැඹුරු වීමය.

සංචාරක කර්මාන්තයට සම්බන්ධ සේවාවන්හි තවදුරටත් පැවති පරිහානිය නිසා සේවා අංශය වර්ධනය වූයේ අවම වශයෙනි. සංචාරකයින්ගේ පැමිණීම සියයට 19 කින් පහත වැටුන අතර, විගැහි වටිනාකම අනුව සංචාරක කර්මාන්තයෙන් ලද ඉපැයීම් සියයට 30 කින් පහත වැටිණි. 1985 දී එම ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 2,000 ක් හෙවත් විගැහි දශ ලක්ෂ 72 ක් පමණ විය. සංචාරක කටයුතු ඉහළතම මට්ටමකට නැග තිබුණු 1982 වර්ෂය හා සැසඳීමේදී, 1985 දී සංචාරකයින්ගේ පැමිණීම සියයට 37 කින් පමණ අඩු විය. සංචාරක කර්මාන්තයේ වූ මෙකී පහත වැටීම හේතුකොට ගෙන හෝටල් ධාරිතා තවදුරටත් ඌණ උපයෝජනයට භාජන වීමත්, හෝටල් කාර්ය මණ්ඩලය අඩු කිරීමත් සංචාරක කර්මාන්තයට සම්බන්ධ අනෙකුත් සේවා දියුණු නොවීමත් සිදු විය.

**මිළ, වැටුප් සහ සේවා නියුක්තිය**

මිළෙහි වර්ධන වේගය අඩු වීම, 1985 ආර්ථික හැඩගැස්මෙහි දක්නට ලැබුන පැහැදිලි ලක්ෂණයකි. කොළඹ පාරිභෝගික මිළ දර්ශකය අනුව, 1985 දී පාරිභෝගික මිළ ගණන් වැඩි වී ඇත්තේ සියයට 1.5 කින් පමණි. මෙය 1984 දී වාර්තා වූ සියයට 17 ක වාර්ෂික සාමාන්‍ය වැඩි වීමේ වේගයට වඩා තියුණු වෙනසක් දක්වීය. ඉකුත් වසරේ දෙසැම්බර් සිට මෙම වසරේ දෙසැම්බර් දක්වා වූ කොළඹ පාරිභෝගික මිළ දර්ශකය (ලක්ෂමය) වැඩි වී ඇත්තේ සියයට 1.5 කිනි. 1983 දෙසැම්බර් සහ 1984 දෙසැම්බර් අතර මිළ දර්ශකයේ වෙනස සියයට 9.5 ක් විය. පාරිභෝගික මිළ ගණන්වල ඇති වූ මෙම හීන වර්ධනය, 1978 න් පසුව දක්නට ලැබුන පහළම මට්ටම වූ අතර, මෙය ජාත්‍යන්තර පාරිභෝගික මිළ ගණන්වල වාර්තා වූ වැඩි වීම හා ඉතා මැනවින් සැසඳේ.

මිළ ගණන්වල වර්ධනය පහළ මට්ටමක පැවතීමට හේතු වූ කරුණු අතර, කෘෂිකාර්මික වෙළෙඳ ද්‍රව්‍ය සුලභ වීම සහ නිෂ්පාදනය වැඩි වීමත්, තේ සහ පොල්වල ජාත්‍යන්තර මිළ ගණන් පහත වැටීමත් ප්‍රධාන තැනක් ගනී. මේ අනුව, ආහාර ද්‍රව්‍ය මිළ වැඩි වූයේ ආන්තික වශයෙනි. ඉන්ධන මිළ ස්ථාවරව පැවතීම සහ 1984 දී සියයට 10.4 කින් වර්ධනය වුවද

1985 දී සියයට 3.2 කින් පමණක් ආනයන මිළ වැඩි වීම වැදගත් හේතු සාධක විය. 1984 දී පනවන ලද දැඩි මූල්‍ය හා ණය ප්‍රතිපත්තීන් තවදුරටත් පැවතීම හා 1984 දී ඇති වූ ප්‍රසාරණාත්මක නොවන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල පසුකාලීන බලපෑමද මෙම ක්‍රියාකාරිත්වයනට උපකාරී විය.

තේ සහ පොල් මිළ ගණන් තියුණු ලෙස පහත වැටීමත්, රබර් මිළ තරමක් පහත වැටීමත් නිසා 1985 දී තොග මිළ දර්ශකය සියයට 50 ක් තරම් ප්‍රමාණයකින් පහත වැටිණි. එහෙත්, එකී අසාමාන්‍ය අඩුවීම කල්පනාකාරී අන්දමින් අර්ථකථනය කළයුතු වෙයි. එසේ වනුයේ, 1984 දී එම දර්ශකයේ වූ විශාල වැඩිවීමට අපනයන මිළ උත්පාතයන් හේතු වීමය.

මෑත වර්ෂවලදී ලැබූ අත්දැකීම්වලට ප්‍රතිවිරුද්ධව 1985 දී මූර්ත වැටුප් සැළකිය යුතු ලෙස වැඩි වූ අතර, ඊට ප්‍රධාන වශයෙන් හේතු වූයේ උද්ධමන වේගය පහළ මට්ටමක පැවතීමය. 1985 ජනවාරි මාසයේ රුපියල් 100 ක අතිරේක දීමනාවක් ගෙවීම නිසා පාසැල් ගුරුවරුන් හැර රාජ්‍ය අංශයේ සේවකයින්ගේ අවම වැටුප් සියයට 15 කින් වැඩි විය. රාජ්‍ය අංශයේ මූර්ත වැටුප් අනුපාතික සියයට 14 කින් වැඩි විය. රජයේ පාසැල් ගුරුවරුන්ගේ වැටුප් ප්‍රතිශෝධනයේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ගේ වැටුප් දර්ශකය සියයට 17 කින් වැඩි වූ අතර, මූර්ත වැටුප් සියයට 15 කින් වැඩි විය. පඩි පාලක සභා යටතේ වන සේවකයින්ගේ වැටුප් සියයට 9 කින් වැඩි විය. විශාලතම වැටුප් වැඩි වීම (සියයට 14) කර්මාන්ත හා වෙළෙඳ කටයුතුවල නිරත වූවන්ගේ වැටුප් වලින් පිළිබිඹු වූ අතර, කෘෂිකාර්මික අංශයේ වැටුප් සියයට 10 කින් වැඩි විය.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය සියයට 1.5 කින් වැඩි වූ අතර, අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිය සියයට 2.4 කින් පහත වැටිණි. අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිය අඩු වීමට හේතු වූ ප්‍රධාන කරුණු වූයේ, රාජ්‍ය වැවිලි අංශය සිය ශ්‍රම බලකාය ප්‍රතිසංවිධානය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් එහි අනියම් සේවකයින්ගේ සේවාවන් නතර කිරීමත්, ලෝහ භාණ්ඩ, සිමෙන්ති, කඩදාසි කර්මාන්ත හා වානේ වැනි සංස්ථාවන්හි සේවා නියුක්තිය පහත වැටීමත්ය. ඛණිජ තෙල්, ගොඩනැගිලි ද්‍රව්‍ය, ටයර් සහ ටියුබ්, රෙදිපිළි, නිවාස කටයුතු සහ ප්‍රවාහන කටයුතු සම්බන්ධ නිෂ්පාදන කාර්යයන් සිදු කෙරෙන අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිය වැඩි විය.

පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳව ස්ථිර දත්තයන් නොමැති නමුදු සංවිධානය වූ සහ සංවිධානය නොවූ යන දෙඅංශයෙන්ම සමන්විත පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය වැඩි වී ඇති බව පෙනේ. එහෙත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තියේ වැඩි වීම ඉකුත් වසරට වඩා මඳ වේගයකින් සිදු වූවා විය හැකිය. 1984-85 දී සියයට 8.6 කින් වර්ධනය වූ සේවා නියුක්තිය, 1985-86 දී සියයට 11 කට ආසන්න ප්‍රමාණයකින් වර්ධනය වෙතැයි අපේක්ෂා කළ හැකි බව, රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ සීමිත වගකීම් සමාගම්වල සැළසුම් කළ ආයෝජන පිළිබඳ සමීක්ෂණයේ සඳහන් වේ.

**වෙළෙඳාම**

1985 වසර වෙළෙඳ කටයුතු අතින් ශ්‍රී ලංකාවට වාසිදායක නොවීය. 1972 න් පසු මුල් වතාවට අපනයන පහත වැටුණු අතර, ඉකුත් දෙවසර හා සසඳන කල ආනයන ඉහළ අනුපාතිකයකින් වැඩුණි.

විගැහි අනුව, අපනයන ඉපැයීම් සියයට 8 කින් පහත වැටුණු අතර, ආනයන වියදම් සියයට 5 කින් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, අපනයන ඉපැයීම් සියයට 44 කින්ද ආනයන වියදම් සියයට 0.6 කින්ද වැඩිවූ 1984 වසර හා සසඳන විට මෙම වසරේදී වෙළෙඳ හිඟයෙහි තියුණු වැඩිවීමක් දක්නට ලැබිණි.

අපනයන පහත වැටීමට බොහෝ සෙයින් හේතු වූයේ, තේ හා රබර්වලින් ලද ඉපැයීම් අඩුවීමය. ජාත්‍යන්තර වෙළෙඳපොළේ පොල් මිළ දැඩි ලෙස පහත වැටුණු නමුදු, පොල් අපනයන ප්‍රමාණය අසාමාන්‍ය ලෙසින් ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් පොල් නිෂ්පාදන අපනයනයෙන් ලත් ඉපැයීම් වැඩි විය. සුළු කෘෂි භෝග හා මැණික් වැනි අනෙකුත් අපනයනද අඩු විය. මීට පෙර ශීඝ්‍ර වැඩිවීම් දක්නට ලැබුණු රෙදිපිළි හා ඇඳුම් අපනයනයන්හිද මූර්ත පහත වැටීමක් සිදු විය.

විශේෂයෙන්ම, ආහාර පාන හා අනෙකුත් පාරිභෝජන භාණ්ඩ ඇතුළු පාරිභෝජන භාණ්ඩ සඳහා වූ වියදම් ඉහළ යාම, ආනයන වැඩි වීමට විශාල වශයෙන් හේතු විය. අපනයන ඉපැයීම් අඩු වන අවස්ථාවකදී පාරිභෝජන ආනයන වැඩි වීමෙන් ගෙවුම් තුලනය කෙරෙහි විශාල බලපෑමක් ඇති විය.

තාවකාලික රේගු දත්ත අනුව ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 49,069 (විගැහි දශ ලක්ෂ 1,776) ක්ද, අපනයන ඉපැයුම් රුපියල් දශ ලක්ෂ 35,035 (විගැහි දශ ලක්ෂ 1,268) ක්ද, විය. මෙහි ප්‍රතිඵලයක් වූ රුපියල් දශ ලක්ෂ 14,034 (විගැහි දශ ලක්ෂ 508) ක හිඟය, ඉකුත් වර්ෂයේ හිඟය වූ රුපියල් දශ ලක්ෂ 9,907 (විගැහි දශ ලක්ෂ 380) ට වඩා විගැහි අනුව සියයට 34 ක වැඩි වීමකි. ප්‍රමාදයන් හා ලේඛනගත කිරීමට අදල වෙනත් සාධක සඳහා රේගු දත්තයන් ගැලපූ කල වෙළෙඳ හිඟය රුපියල් දශ ලක්ෂ 16,710 (විගැහි දශ ලක්ෂ 605) ක් විය. විගැහි අනුව මෙය 1984 දී වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 10,194 (විගැහි දශ ලක්ෂ 391) ක හිඟයට වඩා සියයට 55 ක වැඩි වීමකි.

පසුගිය වසර දෙක තුළ වෙළෙඳ අනුපාතය සැළකිය යුතු ලෙස වර්ධනය වීමෙන් අනතුරුව අපනයන හා ආනයන මිළ ගණන් අවාසිදායක වීමේ ප්‍රතිඵලය වශයෙන් 1985 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ වෙළෙඳ අනුපාතය සියයට 23 ක් තරම් ප්‍රමාණයකින් පහත වැටිණි. මහ බැංකුවේ නව වෙළෙඳ දර්ශක අනුව මැන බලන විට අපනයන මිළ ගණන් සියයට 15 කින් අඩු වූ අතර, ආනයන මිළ ගණන් සියයට 11 කින් වැඩි විය. 1985 වර්ෂයේදී අපනයන / ආනයන අනුපාතය පුළුල් විය. 1984 දී මුළු ආනයන වටිනාකමෙහි අනුපාතයක් වශයෙන් සියයට 79 ක් වූ අපනයන, 1985 දී සියයට 68 දක්වා පහත වැටුණි. මේ අනුව, තමන්ගේම සම්පත් වලින් ආනයන වියදම් පියවීමට තිබූ හැකියාව දුර්වල වූ අතර, විදේශීය මූල්‍යකරණයන් වෙත යොමු වීම වැඩි විය. ආධාර ලබා ගැනීම සම්බන්ධයෙන් වඩා අසීරු ජාත්‍යන්තර ආර්ථික වාතාවරණයක් මතු වෙමින් පවත්නා අවධියකදී, මෙවැනි විදේශ මූල්‍යකරණය පසුතල කර ගත් ආනයන මට්ටමක් ඉදිරියේදී පවත්වාගෙන යාමට නොහැකි වනු ඇත.

## ගෙවුම් තුලනය

ජංගම ගිණුම අනුව මෙන්ම, සමස්ත ශේෂය අනුවද, 1985 ගෙවුම් තුලන තත්ත්වය සැළකිය යුතු ලෙස පිරිහුණි. වර්ෂය තුළදී වෙළෙඳ භාණ්ඩ සහ සේවා ගිණුම්වල හිඟය පුළුල් වූ අතර, ශුද්ධ පෞද්ගලික සංක්‍රාම ආන්තික වශයෙන් පහත වැටුණි. එමෙන්ම නිල සංක්‍රාම සැළකිය යුතු මට්ටමකින් පහත වැටීමක් පෙන්වීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ජංගම ගිණුමේ හිඟය 1984 පැවති සියයට 0.8 සිට 1985 දී සියයට 7.2 දක්වා වැඩි විය.

1984 රුපියල් දශ ලක්ෂ 11,850 (විගැහි දශ ලක්ෂ 453) සමඟ සැසඳීමේදී වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය 1985 දී රුපියල් දශ ලක්ෂ 19,328 (විගැහි දශ ලක්ෂ 697) ක් විය. විගැහි අනුව බලනවිට අපනයන සියයට 10.0 කින් පහත වැටුණු අතර, ආනයන සියයට 5.3 කින් වැඩි විය. වර්ෂය තුළදී පාරිභෝජන භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ සඳහා කෙරුණු ආනයන වියදම වැඩි වූ අතර, ආයෝජන භාණ්ඩ සම්බන්ධයෙන් එය පහත වැටුණි.

විගැහි අනුව සේවා ගිණුමෙහි හිඟය වර්ෂය තුළදී දෙගුණයක් පමණ විය. වරාය, ප්‍රවාහනය හා රක්ෂණය වෙනුවෙන් වූ ශුද්ධ විදේශ විනිමය වැය වීම් ප්‍රමාණය වැඩි වීමත්, සංචාරක කටයුතු වලින් ලැබූ ශුද්ධ විදේශ විනිමය ඉපැයීම් ප්‍රමාණය පහත වැටීමත්, අනෙකුත් විවිධ සේවා වෙනුවෙන් වූ ශුද්ධ වියදම් ප්‍රමාණය වැඩි වීමත් යන කරුණු, සේවා ගිණුමේ හිඟය පුළුල් වීමට ඉවහල් වූ ප්‍රධාන හේතූන් විය. 1985 වසරේදීත් තවදුරටත් පොළී ගෙවීම් සේවා ගිණුමෙහි විශාලතම හර අයිතමය වූ නමුත්, ඒ සම්බන්ධයෙන් වූ ශුද්ධ පිට ගලා යාම 1984 වසරේදී ආන්තික වශයෙන් අඩු වී තිබුණි. 1977 සිට 1981 දක්වා වූ කාලය තුළ ගෙවුම් තුලනය මත වූ පීඩනය සමනය කිරීමට සමත් වූ සේවා ගිණුමට පසුගිය සිව් වසර තුළදී, එම කාර්යය ඒලෙසම ඉටු කිරීමට නුපුළුවන් විය. සේවා ගිණුම තුළින් පිට ගලා ගිය ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණය, 1985 වසරේ ජංගම ගිණුමේ හිඟයෙන් සියයට 30 ක් විය.

පෞද්ගලික සංක්‍රාම වශයෙන් ලැබුන විදේශ විනිමය ප්‍රමාණය රුපියල් අනුව, සියයට 5 කින් වැඩි වූ නමුදු, විගැහි අනුව බලනවිට ආන්තික අඩු වීමක් පෙන්නුම් කළේය. එය, 1985 දී රුපියල් දශ ලක්ෂ 8,020 (විගැහි දශ ලක්ෂ 291) ක් වූ අතර, ඊට පෙර වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 7,653 (විගැහි දශ ලක්ෂ 294) ක් විය. 1985 වර්ෂයේ පෞද්ගලික සංක්‍රාම ශුද්ධ ලැබීම ප්‍රමාණය සියයට 2 කින් පහත වැටී රුපියල් දශ ලක්ෂ 7,298 (විගැහි දශ ලක්ෂ 265) ක්ව පැවතින. ඉකුත් වර්ෂයේ මෙන්ම, මේ වර්ෂයේදීද, තේ වලට පසු ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ දක්වෙන විශාලතම තනි හර අයිතමය වූයේ, පෞද්ගලික සංක්‍රාමයි. යෝජනා ක්‍රම සහ ද්‍රව්‍ය ප්‍රදානයන්ගෙන් සමන්විත නිල සංක්‍රාම ප්‍රමාණය වර්ෂය තුළදී අඩු විය.

පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයටම ලැබුණු ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ප්‍රමාණය ජංගම ගිණුමේ සමස්ත හිඟය පියවීම සඳහා ප්‍රමාණවත් නොවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ රුපියල් දශ ලක්ෂ 1,060 (විගැහි දශ ලක්ෂ 111) ක සමස්ත ශේෂයේ හිඟය, ශුද්ධ විදේශ වත්කම් උපයෝගී කර ගැනීමෙන් පියවනු ලැබීය. සමස්ත ශේෂයේ රුපියල් දශ ලක්ෂ 7,062 (විගැහි දශ ලක්ෂ 297) ක අතිරික්තයක් පැවති 1984 වර්ෂයේ ක්‍රියාකාරිත්වය හා සසඳන විට මෙය වෙනස් ස්වරූපයකි.

ශ්‍රී ලංකාවේ දළ විදේශ වත්කම් ප්‍රමාණය 1985 වර්ෂයේදී විගැහි අනුව සියයට 17 කින් පහත වැටුණි. ගෙවුම් තුලනයේ සමස්ත ස්වරූපයේ ඇති වූ තියුණු පසුබෑම පෙන්නුම් කරමින්, වර්ෂය තුළදී ශුද්ධ විදේශ වත්කම් සියයට 39 කින් පහත වැටුණි. 1985 වර්ෂය අවසානයට පැවති දළ විදේශ වත්කම් ප්‍රමාණය, 1986 දී කිරීමට බලාපොරොත්තු වන මාස 3.8 ක ආනයන වියදම් පියවීමට සෑහුණි.

1985 වර්ෂය තුළදී, ශ්‍රී ලංකා රුපියල සියළුම ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව පහත වැටුණි. එ. ජ. ඩොලරයට අනුරූපව ශ්‍රී ලංකා රුපියලේ අගය සියයට 4.1 කින් පහත වැටිණි. ඩොයිෂ් මාර්කයට මෙන්ම ප්‍රන්ස ප්‍රෑන්කුවට සාපේක්ෂව සියයට 25 කින්ද, ජපන් යෙන්වලට මෙන්ම එක්සත් රාජධානි පවුමට සාපේක්ෂව සියයට 23 කින්ද අවප්‍රමාණ විය.

ප්‍රධාන වෙළෙඳ හවුල් කරුවන්ගේ වෙළෙඳාම මත වූ නාමික විනිමය අනුපාතිකය වශයෙන් හඳුන්වනු ලබන, ශ්‍රී ලංකාවේ නාමික සඵල විනිමය අනුපාතිකය (නා. ස. වි. අ.) 1985 දී සියයට 16.0 කින් පහත වැටුණි. ශ්‍රී ලංකාව හා මෙම වෙළෙඳ හවුල් කරුවන් අතර පවතින උද්ධමන වෙනස්කම් සඳහා ගලපන ලද දර්ශකය වූ මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ. ස. වි. අ.) 1985 දී සියයට 10.8 කින් පහත වැටුණි.

කෙටිකාලීන ණය සහ වෙළෙඳ ණයද ඇතුළත් නොපියවන ලද ශ්‍රී ලංකාවේ මුළු ණය ප්‍රමාණය විගැහි අනුව සියයට 4 කින් වැඩි වූ අතර, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත් කල 1984 දී පැවති සියයට 52 සිට 1985 දී සියයට 54 දක්වා වැඩි විය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් නව ණය ගැනීම නොමැති වීම නිසා, ඉකුත් වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 8,644 (විගැහි දශ ලක්ෂ 328) ක්ව පැවති ශ්‍රී ලංකාවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගෙවීමට ඉතිරිව තිබූ ණය ප්‍රමාණය 1985 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 7,914 (විගැහි දශ ලක්ෂ 293) දක්වා අඩු විය.

භාණ්ඩ හා සේවා වලින් ලැබූ අපනයන ඉපැයීම්වල (විගැහි අනුව) ප්‍රතිශතයක් ලෙස මුළු ණය සේවා ගෙවීම් ගෙන බලනවිට 1984 සියයට 17.5 ක්ව පැවති එය 1985 දී සියයට 22.4 දක්වා වැඩි විය. මෙම තියුණු වැඩි වීමට හේතු වූයේ අපනයන ඉපැයීම් පහත වැටීම සහ ණය සේවා ගෙවීම් වැඩි වීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් කෙරුණු ගණුදෙනු අත්හැර ණය සේවා අනුපාතය බලන විට 1984 දී සියයට 14.5 ක්ව පැවති එය 1985 දී සියයට 18.5 දක්වා වැඩි විය. වෙළෙඳ භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාම ලැබීම්වල අනුපාතයක් වශයෙන් සමස්ත සේවා ගෙවීම් ප්‍රමාණය ගෙන බලනවිට එය 1984 දී වූ සියයට 15.0 සිට 1985 දී සියයට 19.0 දක්වා වැඩි විය.

## රාජ්‍ය මූල්‍ය කටයුතු

1985 දී අයවැය කටයුතු ඉකුත් වර්ෂයට වඩා ප්‍රසාරණාත්මක විය. බොහෝ දුරටම අපනයන භාණ්ඩ මිළ ගණන් අඩුවීම හේතුකොට ගෙන රජයේ ආදායම පහත වැටීමත්, ප්‍රධාන වශයෙන් ආරක්ෂා කටයුතු සම්බන්ධ වියදම නිසා රජයේ වියදම නවදුරටත් පුළුල් වීමත් හේතුවෙන් අයවැය හිඟය වැඩි විය. එහි ප්‍රතිඵලය වූයේ ප්‍රසාරණාත්මක මාර්ග තුළින් හිඟය පියවීමය.

ප්‍රධාන අපනයන ද්‍රව්‍යවල මිළ ගණන් තියුණු ලෙස පහත වැටීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපනයන බදු ආදායම අඩුවීම, රජයේ ආදායම අඩුවීමට බොහෝදුරට හේතු විය. 1985 දී රජය අපනයන බදු වලින් ලද ආදායම සියයට 41 කින් පහත වැටිණි.

රජයේ වියදම රුපියල් දශ ලක්ෂ 53,592 සිට රුපියල් දශ ලක්ෂ 67,103 දක්වා වැඩි විය. වර්තන වියදම සැළකිය යුතු ලෙස වර්ධනය වුවද, වර්තන ගිණුම් කටයුතුවල අතිරික්තයක් ඇති කිරීමට රජය සමත් විය. එහෙත් එහි ප්‍රමාණය ඉකුත් වර්ෂයට වඩා සැළකිය යුතු අන්දමින් පහත වැටුණි. කෙසේ වුවද, රුපියල් දශ ලක්ෂ 31,332 වූ ප්‍රාග්ධන වියදම කලින් වර්ෂයට වඩා සියයට 44 ක වැඩිවීමකි.

රජයේ ආදායම අඩු වීමේ, හා වියදම් වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අයවැයෙහි හිඟය 1984 දී මෙන් දෙගුණයකින් පමණ විශාල විය. එය රුපියල් දශ ලක්ෂ 15,861 සිට රුපියල් දශ ලක්ෂ 29,759 දක්වා ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලය වූයේ 1984 දී දළ දේශීය නිෂ්පාදිත-යෙන් සියයට 10 ක් වූ අයවැය හිඟය 1985 දී සියයට 19 දක්වා ඉහළ යාමය.

අයවැය හිඟය පියවීමේදී විදේශීය හා ප්‍රසාරණාත්මක නොවන මාර්ගවලින් ලබාගත හැකිවූ සම්පත් ප්‍රමාණය අවශ්‍යතාවලට ප්‍රමාණවත් නොවූ හෙයින් ප්‍රසාරණාත්මක මාර්ග වලට යොමු වීමට රජයට සිදුවිය. බැංකු නොවන දේශීය මාර්ගවලින් හිඟය පියවීම රුපියල් දශ ලක්ෂ 6,588 සිට රුපියල් දශ ලක්ෂ 10,597 දක්වා වැඩි විය. අයවැය හිඟයේ විදේශීය මූල්‍යකරණය 1984 දී සියයට 71 ක් වූ අතර, 1985 දී එය සියයට 43 දක්වා පහත වැටිණි. විදේශීය මූල්‍යකරණය 1984 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7 ක් වූ අතර 1985 දී සියයට 8 දක්වා වැඩි විය.

## මූල්‍ය හා ණය වර්ධනයන්

රජයට දෙන ලද ණය තියුණු අන්දමින් වැඩිවීම, 1985 මූල්‍ය වර්ධනය කෙරෙහි විශාල ලෙස බලපෑවේය. රජයට දෙන ලද ශුද්ධ ණය ක්‍රමිකව වර්ධනය වූ අයුරු වැඩියෙන්ම කැපී පෙනෙනුයේ වසරේ දෙවෙනි භාගය තුළදීය. 1985 ජුනි අවසානයේදී සියයට 15 ක් වූ එය 1985 අවසානය වනවිට සියයට 42 දක්වා ඉහළ නැංගේය. 1984 අවසානයේදී සියයට 17 ක අඩුවීමක් පෙන්නුම් කළ රජයට දෙන ලද ශුද්ධ ණය ප්‍රමාණය 1985 දී ඊට ප්‍රතිවිරුද්ධ ලෙස වැඩිවිය.

1985 දී පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය ප්‍රමාණය 1985 දී වැඩි වූයේ අඩු වේගයකිනි. 1984 අවසානයේදී සියයට 11 කින් වර්ධනය වූ පෞද්ගලික අංශයට දෙන ලද දළ ණයෙහි වර්ධන වේගය බොහෝදුරටම සමුපකාරවලට දෙන ලද ණය ප්‍රමාණය සියයට 17 කින් අඩුවීමේ හේතුවෙන් 1985 දී සියයට 9 දක්වා පහත වැටුණි. 1985 වසර මුළුල්ලේම සමුපකාරවලට ණය දීම මේ අන්දමින් අඩුවූයේ වී අලෙවි මණ්ඩලය වී මිළදී ගැනීමේදී ඉටු කළ කාර්ය භාරය සීමිත වීමත්, 1984/85 මහ කන්නයේදී මෙන්ම, 1985 යල කන්නය තුළදී සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ දෙන ලද ණය ප්‍රමාණය සැහෙන ලෙස අඩු වීමත් නිසාය. අනෙකුත් පෞද්ගලික අංශයට දුන් ණයෙහි වර්ධනය සියයට 16 සිට සියයට 11 දක්වා පහත වැටුණි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ 1984 මාර්තු මාසයේදී පනවන ලද සීමාකාරී මූල්‍ය හා ණය ප්‍රතිපත්ති විධිවිධාන තවදුරටත් ඉදිරියට පවත්වා ගෙන යාමත්, විශේෂයෙන්ම තේ අපනයන සඳහා වූ ණය ඉල්ලුම පහත වැටීම හා උද්ධමන වේගය අඩු වීමත්ය. මේ අතර, 1985 අවසානයේ බැංකු ක්‍රමයෙහි විදේශීය වත්කම් (ශුද්ධ) සියයට 7 ක අඩුවීමක් වාර්තා කළේය. 1984 අවසානයේදී මෙකී වත්කම් සියයට 213 කින් වර්ධනය වී තිබිණි.

ඉහතකී වෙනස්වීම්වල ප්‍රතිඵලය වූයේ පුළුල් මුදල් සැපයුමෙහි ($M_2$) වාර්ෂික වර්ධනය 1985 අවසානයේදී සියයට 11 දක්වා පහත වැටීමය. 1984 අවසානයේදී $M_2$ හි වර්ධනය සියයට 17 ක් විය. රජයට දෙන ලද ශුද්ධ ණය ශීඝ්‍රයෙන් වර්ධනය වී තිබියදීත් $M_2$ හි වර්ධනය මෙම මට්ටමේම පවත්වාගත හැකි වූයේ 1985 දී බැංකු ක්‍රමයෙහි අනෙකුත් ශීර්ෂයන් (ශුද්ධ) රුපියල් දශ ලක්ෂ 3,627 කින් සැළකිය යුතු ලෙස වැඩිවීමේ හේතුවෙනි. 1985 අවසානයට නොපියවූ මහ බැංකු සුරැකුම්පත් රුපියල් දශ ලක්ෂ 1,168 ක් වීම හා මහ බැංකුවේ විදේශීය වත්කම්හි ප්‍රතිඇගැයීම අනෙකුත් ශීර්ෂයන්හි (ශුද්ධ) වැඩි වීම කෙරෙහි ප්‍රධාන වශයෙන්ම සාධක විය. මේ අතර, 1984 අවසානයේදී සියයට 14 ක් වූ පටු මුදල් ($M_1$) හි වාර්ෂික වර්ධනය 1985 මුල් කාර්තුව තුළදී පහත වැටී, ඊළඟ දෙමස තුළදී ඉහළ නැග, මැයි අවසානයේදී සියයට 20 ක් තරම් වූ ඉහළ මට්ටමක් කරා එළඹිණ. වසරේ දෙවන භාගය තුළදී $M_1$ වර්ධනය අක්‍රමික වූ අතර, 1985 අවසානයේදී එය සියයට 12 දක්වා පහත වැටුණි. මෙය 1983 හා 1984 අවසානයේදී $M_1$ හි වාර්තාවූ පිළිවෙලින් සියයට 25 ක හා සියයට 14 ක වැඩි වීම හා සැසඳිය හැකිය. උද්ධමන වේගයෙහි අඩුවීම බොහෝදුරට පිළිබිඹු කරමින් 1984 දී පිළිවෙලින් 3.3 ක් හා 3.2 ක් වූ පටු සහ පුළුල් මුදල්වල ආදායම් සංසරණ ප්‍රවේගයන් 1985 දී පිළිවෙලින් 3.0 හා 3.1 දක්වා පහත වැටුණි.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් තැන්පතු පොළී අනුපාතිකයන් අඩු කිරීම සහ ණය සීමාවන් සහ රජයේ වියදම් ඉහළ යාමේ හේතුවෙන් ඇති කරන ලද අධිද්‍රවශීලතා තත්ත්වය මගින් මුලදී සිය තැන්පතු පොළී අනුපාතිකයන්ද පසුව ණය පොළී අනුපාතිකයන්ද අඩු කරලීමට වාණිජ බැංකු පොළඹවනු ලැබීය. 1985 ඔක්තෝබර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය බැංකු ප්‍රධාන වශයෙන්ම ප්‍රමුඛතා ණයදීම් සඳහා වන පොළී අනුපාතිකයන් සියයට 1 සිට සියයට 3 දක්වා වූ ප්‍රමාණයන්ගෙන් අඩු කරනු ලැබීය. වෙළෙඳ බැංකුවල තැන්පතු පොළී අනුපාතිකයන් අඩුවූ නමුදු, ඒවායේ මුළු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු (පුළුල් මුදල්) වැඩිවීම දිගටම සිදුවිය. උද්ධමන වේගය පහත වැටීමේ හේතුවෙන් මූල්‍ය තැන්පතුවලට ප්‍රමාණවත් මූර්ත පොළී අනුපාතිකයක් ලැබීම මෙයට හේතු වූවා විය හැකිය. මූල්‍ය සමාගම් විසින්ද සිය තැන්පතු පොළී අනුපාතිකයන් පහත හෙලන ලදී.

මුදල් වෙළෙඳපොළේ පොළී අනුපාතිකයන් අඩු වීම හා උද්ධමන වේගය පහත වැටීම නිසා 1985 සැප්තැම්බර් 01 වෙනි දින සිට රජයේ සුරැකුම්පත් සඳහා වාර්ෂික පොළී අනුපාතිකය සියයට 16 සිට සියයට 14 දක්වා පහත වැටිණි. ඒවායේ කල්පිරීමේ කාලය තවදුරටත් අවුරුදු 6 ක්ව පැවතිණි. එසේම, මූලික භාණ්ඩාගාර බිල්පත් සඳහා වාර්ෂික පොළිය සියයට 14 සිට සියයට 11.5 දක්වා අඩු වූ අතර, ද්විතීය භාණ්ඩාගාර බිල්පත් සඳහා ගැණුම් හා විකුණුම් අනුපාතිකයන් පිළිවෙලින් සියයට 14.2 හා සියයට 14.0 සිට සියයට 11.5 හා සියයට 11.3 දක්වා පහත වැටිණි.

මහ බැංකු අනුපාතිකය වසරකට සියයට 13 සිට සියයට 11 දක්වා ප්‍රතිශතාංක 2 කින් අඩු කළ අතර වගා හා අලෙවි ප්‍රතිමූල්‍ය පහසුකම්වලට හැර සියළු ප්‍රතිමූල්‍ය අනුපාතිකයන් සඳහා එවැනිම අඩු කිරීමක් වසර අවසානයේදී සිදු කෙරුණි. මෙකී වෙනස්කිරීම අනුව යමින්, භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය වසරකට සියයට 11 දක්වා පහත වැටිණි.

මුදල් වෙළෙඳපොලේ ද්‍රවශීලතා අතිරික්තයක් තිබුණේ වුවද, 1985 දී මහජනයා වෙත අළුතින් ඉදිරිපත් කරන ලද්දේ, රුපියල් දශ ලක්ෂ 87 ක වටිනාකමින් යුත් කොටස් නිකුතුන් තුනක් පමණි. කොටස් වෙළෙඳපොලේ ගණුදෙනු සීමිත වීමෙන් පෙන්නුම් කෙරෙනුයේ ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි පැවැති උපකරණයන්හි සීමිත බවත්, මූල්‍ය වෙළෙඳපොළේ සිට ප්‍රාග්ධන වෙළෙඳපොළ කරා සම්පත් මාරු කිරීම සඳහා ආයතනික සැකැස්මක් නොමැති වීමත්ය.

1984 දී පෞද්ගලික අංශයේ ණය මත පනවන ලද ණය සීමාවන් හා වාණිජ බැංකුවල වැඩිවන තැන්පතු මත පැණවුණු ඉහළ සංචිත අනුපාතයන් 1985 වසර තුළදීද බලපැවැත්විණි. අතිරික්ත ද්‍රවශීලතාවය ඇද ගැනීමේ අදහසින් මහ බැංකුව විසින් සියලු තැන්පතු සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයන් වැඩි කරන ලදී. මෙකී මූල්‍ය ප්‍රතිපත්ති විධිවිධානයන්ට ප්‍රතිචාර දක්වීමක් වශයෙන් පිළිවෙලින් පටු හා පුළුල් මුදල් සඳහා වසර අවසානයට පැවැති මුදල් ගුණකයන් 1984 දී පිළිවෙලින් 1.2 ක් හා 3.1 ක් වූ අතර, 1985 දී ඒවා 1.1 හා 2.8 දක්වා පහත වැටිණි.

1984 දී අනුගමනය කළ සීමාකාරී මූල්‍ය ප්‍රතිපත්තීන්, ප්‍රමුඛතා අංශවලට ප්‍රමාණවත් ලෙස ණය ලැබෙන අයුරින් වරණාත්මක ප්‍රතිපත්තීන්ද සමග දිගටම පවත්වා ගෙන යන ලදී. ආර්ථිකයේ සැපයුම් අංශය නංවාලන අයුරින් ප්‍රමුඛතා අංශවලට ණය ලබාදීම පිණිස 1985 දී පියවර කිහිපයක් ගන්නා ලදී. මේ අරමුණ ඇතිව ගන්නා ලද ප්‍රධාන පියවර අතර අපනයන හා කෘෂි ණය, ණය සීමාවලින් නිදහස් කිරීම, අපනයන සම්බන්ධයෙන් වූ ප්‍රතිමූල්‍ය පොළී අනුපාතිකයන් අඩු කිරීම හා ශ්‍රී ලංකා සංවර්ධන මුදල් සමායතනයෙහි ද්‍රවශීලතා පදනම නංවාලීමද වෙයි.

සිය කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වගකීම් වෙනුවෙන් පවත්වාගත යුතු ව්‍යවස්ථාපිත සංචිතවලින් කොටසක් ශ්‍රී ලංකා සංවර්ධන මුදල් සමායතනයේ පිළිනපත්වලින් තබා ගැනීමට 1985 ජූනි මාසයේදී වාණිජ බැංකුවලට ඉඩ දෙන ලදී. එසේ පවත්වා ගෙන යනු ලබන සංචිත ප්‍රමාණය එක් එක් වාණිජ බැංකුව විසින් සිය කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වගකීම් මත පවත්වාගෙන යනු ලබන ව්‍යවස්ථාපිත සංචිත ප්‍රමාණයෙන් 1/8 ක් නොඉක්මවිය යුතු විය. මෙමගින් පෞද්ගලික අංශයට ණය දීමට යටකී සමායතනයට ඇති හැකියාවද වැඩි විය. 1985 අවසානයේ ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සමායතන පිළිනපත්වල කරන ලද වාණිජ බැංකු ආයෝජන රුපියල් දශ ලක්ෂ 333 ක් විය.